**ශීර්ෂය 296 - ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශීර්ෂය 296 - ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 අගෝස්තු 29 දින ආනයන හා අපනයන පාලක ජනරාල් වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යාවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

--------

**2.1 විසර්ජන ගිණුම**

-----------------

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---------------------------

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 63.19 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 57.05 ක් උපයෝජනයකර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 6.14 ක් හෙවත් සියයට 9.72 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **වියදම** | **2015 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය--** | **ඉතිරිය** | |
| | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | |
| පුනරාවර්තන | 58.29 | 54.39 | 3.90 | 6.69 |
| මූලධන | 4.90 | 2.66 | 2.24 | 45.71 |
| **එකතුව** | **63.19** | **57. 05** | **6. 14** | **9.72** |

**2.2 ආදායම් ගිණුම**

**ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම**

දෙපාර්තමේන්තුව විසින් 2015 වර්ෂය සඳහා ආදායම් සංකේත 10.01.03.00 සඳහා රු.මිලියන 800 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර එම ආදායම් ඇස්තමේන්තුව රු.මිලියන 900 දක්වා සංශෝධනය කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 1,089 ක ආදායම් රැස්කර තිබුණි. එය සංශෝධිත ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 121  වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉක්මවීම/ (ඌනතාවය) ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|
| ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | ඉක්මවීම | |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 900 | 1,089 | 189 | 21 |

**2.3. රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 29601 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 4.42 | 2.12 | 2.20 | 3.12 | 18.00 | 12.22 |

**2.4 අග්‍රිම ගිණුම**

දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනට අංක 7002/0000/00/0048/0015/000 දරන අග්‍රිම ගිණුමේ ශේෂය රු.මිලියන 98.86 ක් විය.

**2.5 විගණන නිරීක්ෂණය**

දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම.

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය |
|---|---|---|
| (i) | විසර්ජන (සම්මත වැය) ලෙජරය | මුදල් රෙගුලාසි 447 |
| (ii) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (iii) | බඩු ලේඛන පොත | මුදල් රෙගුලාසි 454(1) |

### 3.2 ආදායම් ගිණුම

දෙපාර්තමේන්තු ප්‍රධානියා ආදායම් ගණන්දීමේ නිලධාරී වශයෙන් ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරීම, ආදායම් රැස් කිරීම, ගිණුම්ගත කිරීම හා ගිණුම් ඉදිරිපත් කිරීමේ කාර්යභාරය පැවරී තිබුණි. අංක 10.01.03.00 දරන ආදායම් සංකේතයට අදාළව සිදු කළ නියැදි විගණනයේදී පහත සඳහන් අඩුපාඩුව නිරීක්ෂණය විය.

මුදල් පොතේ ලැබීම් ලෙස බලපත්‍ර ගාස්තු හා අනෙකුත් ලැබීම් එකතුව පමණක් සටහන් කර තිබූ අතර එයට අදාළ වර්ගීකරණය කරන ලද ලැබීම් ලේඛනයක් පවත්වා නොතිබුණි.

### 3.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

විෂය අංක 29601 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.544,122 ක් වූ අතර, එම ශේෂ වර්ෂ 01 ක සිට වර්ෂ 02 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

### 3.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

#### 3.4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

2015 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම 2015 පෙබරවාරි 23 දින පිළියෙල කර තිබුණද අයවැය ඇස්තමේන්තු සකස් කිරීමේදී ක්‍රියාකාරී සැලැසුමේ අඩංගු පහත කාර්යයන් සඳහා වාර්ෂික ප්‍රතිපාදන සපයා ගෙන නොතිබුණි.

(අ) ආනයනය හා අපනයනය කරන පාරිභෝගික ද්‍රව්‍යවල තත්ත්වය, ප්‍රමිතිය හා පිරිවිතර නිරීක්ෂණය සඳහා ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදු කිරීම.

(ආ) දැනුවත් කිරීමේ වැඩසටහන් හා වැඩමුළු පැවැත්වීම.

### 3.4.2 අභ්‍යන්තර විගණනය

දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන ඒකකයක් නොතිබුණු අතර 2015 වර්ෂයේ ජුනි මස දක්වා කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව විසින් අභ්‍යන්තර විගණනයක් සිදු කර අභ්‍යන්තර විගණන වාර්තා 2 ක් නිකුත් කර තිබුණි. ඉතිරි කාලපරිච්ඡේදය සඳහා අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක කර නොතිබුණි.

### 3.4.3 විගණන හා කළමනාකරණ කමිටුව

විගණන හා කළමනාකරණ කමිටුව කාර්තුවකට වරක් හෝ රැස්විය යුතු වුවත්, 2015 වර්ෂය සඳහා කමිටුවේ රැස්වීම් වාර 02 ක් පමණක් පවත්වා තිබුණි.

### 3.5 වත්කම් කළමනාකරණය

**වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

2014 ඔක්තෝබර් 17 දිනැති අංක 2/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2015 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදු කර එම වාර්තා 2016 මාර්තු 17 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් එම වාර්තා 2016 ජූලි 27 දින ඉදිරිපත් කර තිබුණි.

### 3.6 කාර්යසාධනය

**ප්‍රධාන කාර්යයන්ට පටහැනි ක්‍රියාකාරකම්**

එතනෝල් හා මෙතනෝල් ආනයනයේදී සුරාබදු දෙපාර්තමේන්තුවේ නිර්දේශ මත ඉදිරිපත් කරන සියළුම එතනෝල් හා මෙතනොල් ආනයන ඉල්ලුම්පත් මඟින් ඉල්ලුම් කර තිබුණු එකතුව ලීටර් 41,535,866 ක් වූ මුළු ප්‍රමාණයන්ටම ආනයන බලපත්‍ර නිකුත් කර තිබුණි.

### 3.7 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 10 | 05 | 05 |
| (ii) | ද්විතීයික මට්ටම | 01 | 01 | - |
| (iii) | තෘතීයික මට්ටම | 58 | 52 | 06 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 19 | 17 | 02 |
| | **එකතුව** | **88** | **75** | **13** |